වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2007

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
இலங்கை போக்குவரத்துச் சபை
SRI LANKA TRANSPORT BOARD

අංක 200, කිරුළ පාර - නාරාහේන්පිට - කොළඹ 05
இல:200, கிருல வீதி, நாராஹேன்பிட்ட, கொழும்பு 05
No: 200, Kirula Road, Narahenpita, Colombo 05

වාර්ෂික වාර්තාව

2007

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

1. දැක්ම, මෙහෙවර, අරමුණ හා පරමාර්ථ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. 2007 තුල කාර්යසාධනය සහ ප්‍රගති සමාලෝචනය

5. අවසාන ගිණුම්

6. විගණකාධිපති වාර්තාව

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායි, සුවපහසු මර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායි කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශිය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දිමත් ප්‍රධාන කාර්යලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක ප්‍රමාණාත්මක සහ කාර්යක්‍ෂමව හා ඵලදායි බස් සේවාවක් සැපයිම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයිම.

3. මුල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැර දමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. කොටුව මධ්‍යම බස් නැවතුම් පොලේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයිම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු / පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන්වලදී බස සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයිම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්‍ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළුපැවැත්වීම.

11. ප්‍රාදේශිය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයිම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදිම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම පධාන කාර්යාලයේ මාර්ගස්ථ ගබඩාවෙන් පවත්වාගෙන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්‍ෂක විමර්ශන, හදිසි වැටලිම් සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනය කරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර්රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාර්ත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10 ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදි. ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින් ලං.ග.ම විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්‍යක්ෂම හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරන ලද පාඩු දිගින් දිගටම වැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකිවීම නිසාත් මගින් ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදි.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලිකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදි. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරාගන්නා ලදි. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදාදෙන ලද අතර ඉතිරි කොටස් මහ භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1993 වර්ෂයේදී අවසන් කරන ලදි. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත්නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදි. සේවක අතිරික්තයන්, විනය බරපතලසේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරීත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය මගකීම, වෘත්තිමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්‍යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තිය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂණයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් "2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත" මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදි.

සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉදිරි ගමනට වැදගත්ම පියවරක් තැබූ වර්ෂයක් හැටියට 2007 වර්ෂය හැඳින්විය හැක. කාර්යසාධනය වඩාත් සාර්ථක ලෙස පෙළ ගැස්වීමට හැ මණ්ඩලය එතෙක් ආ ගමන සියයට වැඩි ප්‍රමාණයකින් නිවැරදි කර ගැනීමට, ලංගමයේ සියළුම තනතුරු සඳහා අභිනවයෙන් නිලධාරී පත්කිරීම 2007 වර්ෂයේ ලැබූ විශාල ජයග්‍රහණයකි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීමෙන් පසු ගෙවුන වර්ෂ 2 ක පමණ වූ අතරමැදි කාලය නිමා කරමින් ගත්තාවූ මෙම තීන්දුව නිසා සියළුම කටයුතු යම්කිසි විනයානුකූලරාමුවක් තුල ක්‍රියාත්මක වීම ඇරඹින.

අභිනවයෙන් පිහිටවූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට සාමාන්‍යාධිකාරී මහතකු හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මහතුන් හතරදෙනෙකුද, කොට්ඨාශ ප්‍රධාන මහතුන්ද, පත්කර ගන්නා ලද අතර, ප්‍රාදේශීය කාර්යාලවලට ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර ඇතුළු නිලධාරීන්, අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම ජයග්‍රාහී මාවතේ පෙර නිමිත්තක් විය.

2007 වර්ෂයේ රථ ඇණියට අළුතින් බස්රථ 766 ක් එක් වූ අතර, ටාටා එන්ජින් කට්ටල 135 ක් හා ලේලන්ඩ් එන්ජින් කට්ටල 135 ක් ද, ධාවනයෙන් නතර වූ බස්රථ අළුත්වැඩියාව සඳහා ලැබිණ. ඒ අනුව2 005 හා 2006 වර්ෂවලට වඩා වැඩි බස්රථ ප්‍රමාණයක් ධාවනය කරවීමට හැකි විය. මෙහි ප්‍රතිඵලයක්හ ැටියට 2007 වර්ෂයේදී 2006 වර්ෂයට වඩා කිලෝමීටර් 122,000 ක් දිනකට ධාවනය කරගත හැකිවිය.ෙ මය පොදු ජනතාව ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැක.

පොදු ජනතාවට කල උපකාරයට ප්‍රති උපකාර හැටියට 2007 වර්ෂයේ කාර්යසාධනය ඉතා ඉහල මට්ටමක පැවති බව සංඛ්‍යාලේඛණ මගින් පැහැදිලිය. මාර්ගලේඛණ ආදායම 2006 ට වඩා රුපියල් මිලියන 7.6 කින් දිනකට වැඩි වූ අතර, එය 35.02% ක වැඩිවීමකි. වාර ප්‍රවේශපත්‍ර ආදායම 2006 ට වඩා රුපියල් 439,000 කින් පමණ දිනකට වැඩිවූ අතර, එය 80.71% ක වැඩි වීමකි

ආදායම් තත්වය ඒ ආකාරයෙන් වැඩිවන විට මහා භාණ්ඩාගාරයෙන් ලබාදීමට අයවැයෙන් අනුමත වූ මුදල් අඩුවෙන් ලැබීමද සිදුවිය. ප්‍රාග්ධන වියදම් සඳහා 2006 ට වඩා මිලියන 629 ක් අඩුවෙන් අනුමත කර තිබූ අතර, අනුමත ප්‍රමාණයෙනුත් 83% ක් පමණක් ලබාදී තිබිණ. පුනරාවර්තන වියදම් සඳහා 2006 ට වඩා මිලියන 853 ක් අඩුවෙන් අනුමත කර තිබූ අතර, අනුමත ප්‍රමාණයෙනුත් 96% ක් පමණක් ලබාදී තිබිණ.

මේ අනුව ආයතනයේ මූල්‍ය තත්වය දියුණුකර ගැනීම දැඩි අභියෝගයක් වූ අතර, මාර්ග ලේඛණ ආදායම හා අනිකුත් ආදායම් සතුටුදායක ලෙස වර්ධනය වී තිබීම ජයග්‍රහණයක් විය. මෙම අභියෝග සියල්ලන්ගේම සහයෝගයෙන් ජය ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවන බව එමගින් පැහැදිලි විය.

ශශි වෙල්ගම.
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

සැලසුම් හා සංවර්ධන අංශය

සියළු ඩිපෝ හා ප්‍රාදේශීය කර්යාලවලට අයත් සම්පිංඩන ම ාසක ලාභා ලාභ වාර්ථාව හා ඒ පිළිබඳ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම, අනාර්ථික මාර්ග වල සහනාධාර ලබා ගැනීම සඳහා අදාල වාර්තා පිළියෙල කර ප්‍රවාහන කොමිසමට ඉදිරිපත් කිරීම. වාර ප්‍රවේශපත්‍ර ප්‍රතිධාන ලබා ගැනීම සඳහා වූ වාර්තා, ත්‍රෛයි මාසික බැරකම් වාර්තා, ප්‍රාදේශීය වැඩපලවල්, රියදුරු පාසැල් හා සංචාරක බංගලා ආදියට අයත් මාසික ලාභා ලාභ වාර්තා පිළිබඳ සම්පිංඩන වාර්තා පිළියෙල කිරීම. සාමාන්‍යාධිකාරී හා සභාපතිතුමාගේ සාකච්ජාවලට අවශ්‍ය කරන වාර්තා හා සංඛ්‍යා ලේඛණ පිළියෙල කිරම, ප්‍රවාහන අමාත්‍යාංශය ඉල්ලා සිටින විශ්ලේෂණය කරන ලද සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කිරීම, ඉහල කළමණාකාරිත්වයේ සාකච්ජා වලට අදාල වාර්තා පිළියෙල කිරීම.

ඉහත දැක්වෙන වාර්තා කළමණාකරන තිරණ ගැනීම හා ඩිපෝ සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගි වී ඇතිඅතර, පිළියම් යෙදීමේදි දුර්වල තැන් හදුනා ගැනීමට ද බෙහෙවින් උපයෝගි වී ඇත.

අභ්‍යන්තර විගණන අංශය

2007 වර්ෂයේ නිකුත් කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව 1350 කි. ඒ තුලින් අයවීමට ඇති මුදල රු. 14,272,995.44 කි.

ලේකම් කොට්ඨාශය

2007 වර්ෂය තුල නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වූ අතර එකී වර්ෂය තුල හදිසි රැස්වීම් 01 සමඟ රැස්වීම් වාර 15 ක් පවත්වා ඇත.

ටෙන්ඩර් මණ්ඩලය

- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සහ ඩිපෝවන් සඳහා අවශ්‍ය මුද්‍රණ කටයුතු සඳහා මිල කැඳවා මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම.
- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සහ ඩිපෝවන් සඳහා අවභ්‍ය කාර්යාලිය උපකාරණ (භාණ්ඩ) මිලදී ගැනිම සඳහා මිලගණන් කැඳවීම සහ මිලගණන් ලබාදිම.
- ඩිපෝවන සහ ප්‍රාදේශීය වැඩපල සඳහා අවශ්‍ය අමතර කොටස් මලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවීම සහ අදාල මිලගණන් ලබාදිම.
- සිවිල් ඉංජිනේරු කාර්යයන් සඳහා මිල ගණන් කැඳවීම.
- අබලි බස්රථ, අබලි ද්‍රව්‍ය ආදි භාවිතයෙන් ඉවත් කරන ද්‍රව්‍ය අපහරණය කිරීම සම්බන්ධ සියලු කාර්ය යන් සිදු කිරීම.

ආරක්ෂක අංශය

- ශ්‍රී ලංගමට අයත් සියලුම ආයතනයන්හි මානව හා අනෙකුත් සම්පත් වෙත අවැසි දෛනික ආරක්ෂාව රැකවරණය හා සුරක්ෂිතභාවය ලබාදීම.

- ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි වැදලත් ස්ථාන හා ප්‍රභූ ආරක්ෂාව සැපයීම, රථ වාහන නැවැත්වීම, පාලනය කිරීම අදාල ආයතනයන් වෙත කරණු ලබන සියලුම සැපයීම්හි නිකුත්කිරීම් අධීක්ෂණය කිරීම.

- දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි ගිනි නිවීම් උපකරණ නඩත්තු කිරීම හා ඒ පිළිබඳව අධීක්ෂණකටයුතු කිරීම.

- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය ඇතුලු සියලුම සේවා ස්ථානවල සේවක මහත්ම/ මහත්මීන්ට සෘජුවම නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම.

වාණිජ හා සම්පාදක කොට්ඨාශය

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුල ඩිපෝ, ප්‍රාදේශික සහ ප්‍රාදේශිය වැඩපොලවල් වලට නිකුත් කරන ලදඅමතර කොටස් වල වටිනාකම.

වර්ෂය	මධ්‍යම ගබඩාව කටුබැද්ද	ප්‍රධාන ගබඩාව නාරාහේන්පිට	එකතුව
2007	රු. 211,104,023.00 නව එන්ජින් කට්ටල් 135 ක් ද නිකුත් කර ඇත.	රු. 103,517,094.86 (අමතර කොටස්) රු. 128,478,225.00 (ටයර් කිට්) රු. 26,687,266.00 (බැටරි)	රු. 258,682,585.86



ධාවන කොට්ඨාශය

බස්රථ ඇණිය	8200
ධාවන තත්වයේ පවතින බස් රථ	4669
ධාවනය කල බස්රථ ගණන	4116
ධාවනය කල බස්රථ ධාවනය කල හැකි බස්රථ ඇණියේ ප්‍රතිශතයක් ලෙස	57%
ධාවනය කල බස්ථ‍ෙ ප්‍රමාණය රථ ඇණියේ ප්‍රතිශතයක් ලෙස	50%
ධාවනය කල බස්රථ ධාවන තත්වයේ පවතින රථ ඇණියේ ප්‍රතිශතයක් ලෙස	88%
ධාවන කල මුළු කිලෝ මීටර් ගණන	26193677
මුළු ආදායම	රු. 1,384,924,742
මාර්ග ලේඛණ ආදායම	989,449,327
මාර්ග ලේඛණ ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස	77%
කිලෝ මීටරයකට ආදායම	52.87
මුළු වියදම	1,370,745,924
කිලෝ මීටරයකට වියදම	52.33
ලාභය හෝ අලාභය	(3.35)

2006 සහ 2007 වසර වලදී ධාවනය කල කිලෝමීටර් ගණන වාර්තාගත ලෙස ඉහල ගොස් ඇත.

2004 දිනකට සාමාන්‍ය ධාවන කිලෝමීටර්	779,729
2005 දිනකට සාමාන්‍ය ධාවන කිලෝමීටර්	679,091
2006 දිනකට සාමාන්‍ය ධාවන කිලෝමීටර්	713,753
2007 දිනකට සාමාන්‍ය ධාවන කිලෝමීටර්	835,313

ධාවන කාටයුතු වලට අනුව දිනක මාර්ග ලේඛණ ආදායම ඉතා ඉහල අගයක් දක්වා වර්ධනය වී ඇත.

	රු. මිලි
2004 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	16.5
2005 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	17.6
2006 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	21.7
2007 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	29.3



දිනක සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම 20% වැඩි වීමේදි දිනක සාමාන්‍ය වාර ප්‍රවේශපත්‍ර ආදායම 40% ඉහල ගොස් ඇත.

2004 දිනකට සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	රු.	737,779
2005 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	රු.	780,368
2006 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	රු.	544,749
2007 සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම	රු.	984430



කාර්මික අංශය

ප්‍රදේශිය වැඩපල මගින් සිදුකල නිෂ්පාදන වටිනාකම

වර්ගය	ඒකකය	වටිනාකම (රු)
එංජින්	563	59,115,000.00
ගියර් කට්ටල	411	18,289,500.00
ඇක්සල්	47	2,350,000.00
බස්රථ වල බඳ අලුත්වැඩියාව	144	19,080,000.00
පොම්ප අලුත්වැඩියාව	385	2,695,500.00
ඉන්ජෙක්ටර්	1274	955,500.00
ටයර්	960	2,016,000.00
		104,501,000.00





නව බස්රථ ලබාදීම

2007 වසරේ නව බස්රථ 766 ක් ලබාදී ඇත.

නව එංජින් කට්ටල ලබාදීම

ටාටා එන්ජින් කට්ටල 135 ක් සහ ලේලන්ඩ් එන්ජින් කට්ටල 135 ක් 2007 වසර තුලදී ලබාදී ඇත.

ජංගම පරීක්ෂණ අංශය

මණ්ඩලයේ මාර්ග ලේඛණ ආදායම අවම වශයෙන් 25% ක ප්‍රමාණයක් සොරකම් කෙරෙන බව ගණන් බලා ඇත. එම නිසා විශේෂ පරීක්ෂණ කණ්ඩායම් යොදා ඇති අතර පහත දැක්වෙන සංඛ්‍යා ලේඛණ මගින් අහිමි වන ආදායම දක්වා ඇත.

වර්ෂය	බරපතල	සුළු පරිමාන වංචා	ප්‍රවේශ පත්‍ර නොගෙන ගමන් කල මගීන්ගෙන් අයකර ඇති දඩ මුදල
2007	884	3340	රු. 1,027,054.50

මානව සම්පත් කොට්ඨාශය

2007 දි සේවක සංඛ්‍යාව සේවක ශ්‍රෙණි අනුව

රියදුරු	8,826
කොන්දොස්තර	8,326
කාර්මික	5,798
වෙනත්	14,194
	37,144



ස්ථිර සෙවක සංඛ්‍යාව පහත පරිදි වේ.

ස්ථිර	34,708
කොන්දොස්තර	1,170
කාර්මික	953
වෙනත්	313
	37,144



විධායක සේවක සංඛ්‍යාව සියලුම සේවක සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස

විධායක	2,502
සියලුම වෙනත්	35,092



ගිණුම් ප්‍රතිපත්ති :

1. ශ්‍රිලංකා ගිණුම් සම්මතයන් හා ඓතිහාසික පිරිවැය පදනම් කර පොදුවේ පිළිගත් ගිණුම් මූල්‍ය ධර් ම අනුව ප්‍රකාශණ පිළියෙල කර ඇති අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බාහිර අංශයෙන්ගේ ඒකකවල මූල්‍ය ප්‍රතිඵල ඇතුලත් කිරීමෙන් පසු ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත.

2. මණ්ඩලයේ ගිණුම් හා ශේෂ පත්‍රය පිළියෙල කිරීමේදී සාමාන්‍ය සම්ප්‍රදායානුකූලව පිළිගත් ගණකාධික රණ මූලධර්මයන් අනුගමනය කර ඇති අතර, ගිණුමු කාලයෙන් කාලයට ගිණුම් ප්‍රතිපත්ති සමාන ලෙ ස
යොදාගෙන ඇත. ගිණුම් කාලයට අදාල උපචය වූ ආදායම් හා වියදම් ප්‍රකාශණවල පෙන්වා ඇත.

3. ස්ථාවර වත්කම් ශේෂ පත්‍රයේ පෙන්වා ඇත්තේ පිරිවැයෙන් ක්‍ෂය අඩු කළ වටිනාකමයි. ස්ථාවර වත් කම්වල පිරිවැයෙන් ක්‍ෂය අඩුකර ශේෂ පත්‍රය පෙන්වා ඇතග කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ස්ථාවර වත්කම් නොසලකන ලදි. රු. 23,190,343/= ක් වටිනා ඉඩම් භුක්ති විදින නමුත්, ඒවායේ අයිතිය මෙතෙක් මණ්ඩලය වෙත පැවරී නැත. ඉඩම්වල සම්පූර්ණ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ තබා පෙන්වානැති නමුත්, කර ඇති ගෙවීම් ස්ථාවර වත්කම් වෙනුවෙන් අත්තිකාරම් රු. 8,299,517/= ක් ය නුවෙන්
පෙන්වා ඇත.

4. මිළදී ගත් වර්ෂයේ ක්‍ෂය ගණනය නොකරන අතර ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ගණනය කරනු ලබයි. ක්‍ෂය ගණනය කිරීම පහත අනුපාත අනුව සරල මාර්ග ක්‍රමයට සිදුකරනු ලබ යි.

ගොඩනැඟිලි	2.5%
බස්රථ හා වෙනත් වාහන	12.5%
පිරියත හා උපකරණ	10%
ලි බඩු හා සවිකිරීම්	10%
පරිගණක	25%

5. සේවකයින් විශ්‍රාම යාමේදී ගෙවීම් සඳහා සේවය කල සෑම වර්ෂයකටම මසක වේතන ප්‍රතිපාදනය කරනු ලැබේ. මෙය සෑහෙන හා සාධාරණ ප්‍රතිපාදනයකි.

6. බොල්ණය වෙන්කිරීම් සඳහා ගණනය කිරීම් විවිධ යුධ හමුදාවේ විශේෂ චාරිකා හා පොලිස් වව්වර් යනාදියෙන් අනුපාතය 5% වේ.

7. තොග අගය කිරීම් ගණනය කොට ඇත්තේ පෙර ලැබීම් පෙර නිකුත් කිරීමේ ක්‍රමය අනුවය.

8. ශ්‍රී ලංකා ගිණුම් සම්මතිය 24 අනුව බස් මිළදී ගැනිම සදහා රජයෙන් දෙනු ලබන ප්‍රදානය ආදාය ම් වශා යන් පිළිගෙන ඇත. අවුරුදු 08 ඵලදායි කාලයෙන් පසුව පොතෙන් ලියා හැරීමට

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ආර්ටී/බී/එස්එල්ටීබී/ එෆ්එස්/2007	ඔබේ අංකය / உமது இல / Your No.:	දිනය / திகதி / Date: 2013 [illegible] දින

සභාපති,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2007 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන්වල සාරාංශයකින් සමන්විත 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලසීමාව තුළ විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව වූ වාර්තාවක් දැනටමත් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම දූෂණ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ප්‍රකාශ කිරීම සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028-34 | ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223 | ඉලෙක්ට්‍රොනික් තැපැල / மின்-அஞ்சல் / E-mail: oaggov@sltnet.lk

1.4 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.4, 2.2.5, 2.2.6, 2.2.7,2.2.8 හා 2.2.9 යන ඡේදයන්හි දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි නිර්ණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය වියාචනය

මෙම වාර්තාවේ 2.2.4, 2.2.5, 2.2.6, 2.2.7,2.2.8 හා 2.2.9 යන ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2008 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 3 යුත් මාස 06 ක ප්‍රමාදයකින් පසු 2011 සැප්තැම්බර් 19 දිනදීය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03 ට අනුව ආදායම් හා වියදම් වෙන වෙනම ගිණුම්වල සටහන් කළයුතු වුවද, ප්‍රධාන කාර්යාලයෙහි වරිපනම් හා බදු ගිණුමෙහි දැක්වූ කුලී ආදායම් වූ රු.1,268,784 ක මුදල හා ගෙවූ වරිපනම් වියදම් වූ රු.738,910ක මුදල ගිණුම්ගත කිරීම වෙනුවට වරිපනම් හා බදු ගිණුමේ රු.529,874ක බැර ශේෂයක් පැවතුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.මිලියන 316.523 ක් ලෙස දක්වා තිබූ නමුත් එම අගය වෙන් වෙන්ව සඳහන්ව නොතිබුණි. කෙසේ වුවද ගොඩනැගිලිවල අගය, දක්වා තිබූ මුළු අගයෙන් 50% ක් වූ රු.මිලියන 158.261 ක් ලෙස සලකා සරල මාර්ග ක්‍රමය මත 2.5% ක් වනම් රු.මිලියන 3.956 ක් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) 2006 දෙසැම්බර් 31 දිනට අඩමාණ ණය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.89,721,206 ක් වූ අතර 2007 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.22,149,928ක් දක්වා අඩුකර තිබුණි. ඒ අනුව අඩමාණ ණය අඩු වෙන්කිරීම වූ රු.67,571,278 ක මුදල ලාභාලාභ ගිණුමට බැර කළයුතු වුවද පෙර වර්ෂයේ ලාභාලාභ ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එසේම වියදමක් ලෙස රු.22,149,928 ක අගයක් ලාභාලාභ ගිණුමට හර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.89,721,206 ක අගයකින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

තවද 2007 දෙසැම්බර් 31 දිනට අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය වූ රු.22,149,928ක අඩමාණ ණය ගැති ශේෂයෙන් අඩුකළ යුතු වුවද ඒ වෙනුවට රු. 44,299,856ක මුදලක් අඩුකර තිබීම නිසා 2007 දෙසැම්බර් 31 දිනට ණය ගැති ශේෂය රු.22, 149,928 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2006 වර්ෂය සඳහා අඩමාණ ණය වෙන් කිරීමේදී රු.69,829,294 ක් වෙනුවට රු.89,721,207 ක මුදලක් වෙන්කර තිබීම නිසා 2007 ජනවාරි 01 දිනට අඩමාණ ණය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.19,891,913 ක් වැඩියෙන් ද එදිනට වූ ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දැක්වුණි.

(ඈ) අර්ථසාධක අරමුදල් ලැබිය යුතු ණය ගිණුමේ ශේෂය වූ රු.53,488,293 ක මුදල ප්‍රධාන කාර්යාලයේ අර්ථසාධක අරමුදල් වියදම් තුළ සටහන් වීම නිසා අර්ථසාධක අරමුදල් වියදම් රු.53,488,293 ක් වැඩියෙන් ද අර්ථසාධක අරමුදල් ලැබිය යුතු ණය ගිණුම අඩුවෙන් ද දැක්විණි.

(ඉ) 2007 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ රු.1,331,797 ක සඳහා උපචිත වියදම් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඩ) ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු රු.169,327,981 ක ආදායම් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී එම වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම වරද නිවැරදි කිරීමේදී අදාල ආදායම් ගිණුම් හර කිරීම වෙනුවට රු. 4,686,463 ක ලෙසක් වියදම් ගිණුම් 03 ක හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද,සමාලෝචිත වර්ෂයට අදාලව රු. 1,772,817 ක වූ ලැබිය යුතු පැරණි ප්‍රධාන ආදායම ද්‍රවකටන වියදම් ගිණුමට සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් අදාල ආදායම් හා වියදම් අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ඪ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යාලය විසින් ගෙවනු ලැබූ වියදම් රු.3,822,908ක් වූ ගමන් වියදම් වෙනත් වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ණ) ප්‍රධාන කාර්යාලය විසින් වැයකර තිබූ රු.1,785,088 ක ප්‍රචාරණ වියදම, ප්‍රචාරණ වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට වෙනත් වියදම් යටතේ ගිණුම්ගත කිරීම නිසා රු.1,785,088කින් ප්‍රචාරණ වියදම් අඩුවෙන දැක්වුණි.

(ත) සමාලෝචිත වර්ෂය තුළ බස් සමාගම් 6 කට අදාල විත්තම් හා බැරතම් පිළිවෙළින් වටිනාවෙන් රු.217,685,421 ක් හා රු.369,038,052 ක් ප්‍රධාන කාර්යාලය වෙත පවරාගැනීමේදී විත්තම් පුනරාගණනය කර නොතිබුණු එකට බැරතම් සකස්කර කර නොතිබුණි.

(ථ) ලැබිය යුතුව පැවති පොලිස් හා අනතුරු ගමන් බලපත්‍ර ආදායම් වටිනාව රු.17,367,713 ක් ලෙස සමුද්‍රා ගමන් බලපත්‍ර ආදායම් ගිණුමේ සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් සමුද්‍රා ගමන් බලපත්‍ර ගිණුම වැඩියෙන්ද, පොලිස් ගමන් බලපත්‍ර ආදායම් ගිණුම හා අනතුරු ගමන් බලපත්‍ර ආදායම් ගිණුම පිළිවෙලින් රු.7,824,495 කින් හා රු.9,543,218 කින්ද අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ද) 2006 සහ 2007 වර්ෂවල බස්රථ විකුණුම් ප්‍රාග්ධන ගණනය කිරීමේදී බස්රථ වල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගරහිත බස්රථ ගිණුමට හා ගරහිත බස්රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුමට බැලපත්‍ර වෙනුවට බස්රථ ගිණුමට හා බස්රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුමට බැලපත්‍ර හේතුවෙන් ගරහිත බස්රථ ගිණුම හා ගරහිත බස්රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම පිළිවෙලින් රු.202,057,341 කින් හා රු.185,362,986 කින් වැඩියෙන් දැක්විණි.

(ධ) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල හොත ප්‍රධාන කාර්යාලය වෙත පවරා ගැනීමේදී රු.54,454ක හොත ශේෂයක් බැර ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(න) බස් සමාගම් පවරා ගැනීමේදී දකුණු කොළඹ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයෙහි ණය හිමියන්ගේ ගිණුමේ රු. 27,097,630 ක බැර ශේෂයෙන් ද රු. 27,017,621 ක හර

ශේෂයක්ද පවරාගෙන තිබුණි. පවරාගත් සෑම ශේෂයක් වැරදි ගිණුම්ගත වීමක හෝ ගෙවූවක් සිදුව තිබුණද එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) සේවක අර්ථසාධක අරමුදලට මණ්ඩලයේ දායකත්වය සේවකයින්ගේ කොටසේ වැටුපෙන් 12 % ක් හා පසුව සේවකයින්ගේ කොටසේ වැටුපෙන් 15 % ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට මාසික වැටුපෙන් 3% ක් ද අඩුකර තිබුණි. ඒ අනුව සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සහ අර්ථසාධක අරමුදල අතර දායකත්ව සමානුපාතයේ 1:4 හෝ 1:5 අතර අනුපාතයක් පැවතිය යුතුය. එසේම ගිණුම්ගත කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව එම ගිණුම් සැසඳීමේදී විචලනයන් නිරීක්ෂණය විය.

(ඝ) 2007 දෙසැම්බර් 31 දිනට භාරගත මුදල් රු.154,705 ක් බැර ශේෂයක් ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

(ච) ප්‍රාදේශීය කාර්යාලවල එකතුව රු.46,249 කට ලැබිය යුතු ගිණුම් 2ක ශේෂයන් බැර අගයන් ලෙස දක්වා තිබුණි.

2.2.4 නොසැසඳු පාලන ගිණුම්

2011 ජූලි 02 දිනැති මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක කළමනාකාරතුමාගේ ලිපිය අනුව 2007 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ගබඩාවල පැවති අවසන් තොගයේ වටිනාකම රු.69,975,691 ක් වූ අතර, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලින් පවරාගෙන තිබූ තොගවල අගය රු.88,946,412 ක් විය. මණ්ඩලය විසින් තොග ගණනය කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ තොගය ලෙස රු.1,075,987,219 ක අගයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ අනුව අවසන් තොගයේ වටිනාකම පිළිබඳව විගණනයේදී පිළිගත නොහැකි විය.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

සංස්ථාපනය කළ දිනට එනම් 2005 ඔක්තෝබර් 19 දිනට පවරාගත් බස් සමාගම් 11ක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සහ සේවක කොටස් ප්‍රාග්ධනය මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 4,993,886,870 ක් වූ අතර සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව රු. 4,356,035,020 ක් වීමෙන් රු.637,851,850 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව :		
- සේවකයින්ට නිකුත් කළ කොටස් ප්‍රමාණය	41,114,447	
- භාණ්ඩාගාරයට නිකුත් කළ කොටස් ප්‍රමාණය	394,489,055	
කොටස් වල මුළු එකතුව		435,603,502
රු.10 බැගින් වූ කොටස්වල නාමික අගය		රු.4,356,035,020
2005 ඔක්තෝබර් 18 දිනට බාහිර විගණකයන් වාර්තා අනුව කොටස්වල නාමික අගය		රු.4,993,886,870
වෙනස		රු.637,851,850

2.2.6 අවිනිශ්චිත ගිණුම්

2007 දෙසැම්බර් 31 දිනට පැවති අවිනිශ්චිත ගිණුම් 10 ක එකතුව රු.718,646,012ක හර හා බැර ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 31 දින වන විටත් දීර්ඝ කාලයක සිට පැවත එන ප්‍රධාන කාර්යාලයේ එකතුව රු. 112,864,736 ක් වූ ලැබිය යුතු ශේෂයන් 14 ක් සමාලෝචිත වර්ෂය දක්වාත් අයකර ගැනීමට කටයුතු නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ රු.2,218,562,124 ක් වූ ණයගැති ශේෂය තුළ ඇතුළත් වසරකට වඩා පැරණි රු.1,293,026,267 ක් වූ ණයගැති ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 25 කට අධික කාලයක සිට පැවත එන මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු දිගු කාලීන ණය ගිණුම් 5 ක ශේෂයන්ගේ එකතුව වූ රු.1,976,660,492 ක් නිරවුල් කිරීමකින් තොරව 2007 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණි.

(ඈ) 2007 දෙසැම්බර් 31 දිනට ඉන්දු ශ්‍රී ලංකා ණය මුදල් ශේෂය රු.38,015,684 ක් වූ අතර ඊට වෙනුවෙන් ගෙවිය යුතු ණය පොලී ගිණුමේ ශේෂය රු. 1,176,074,088 ක් විය. මේ

සම්බන්ධයෙන් වූ කාල විශ්ලේෂණයක ද විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2005 ඔක්තෝබර් 18 දින මණ්ඩලය පිහිටුවීමේදී පවරා ගන්නා ලද එකතුව රු. 1,174,219,783 ක් වූ දිගු කාලීන වගකීම් ශේෂ 16 ක් 2007 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණු අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2005 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණු රු.4,893,293 ක් වූ අත්තිකාරම් ශේෂයන් දෙකක් 2007 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(උ) 2006 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල වලින් පැවති රු.1,231,331 ක මාර්ගස්ථ ඉන්ධන ගෙනගිය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පවරා ගැනීමෙන් පසුව 2007 දෙසැම්බර් 31 දක්වා වර්ෂයකට අධික කාලයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) කෙරගෙන යන වැඩ ගොඩනැගිලි ගිණුමේ ශේෂය ලෙස දක්වා තිබුණු රු.35,751,493 ක වටිනාකම් දීර්ඝ කාලයක සිට ගිණුම්වල පැවති අතර අදාළ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

	විෂයය	වටිනාකම		ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.		
(අ)	ස්ථාවර වත්කම්	6,057,089,897	(i)	ස්ථාවර වත්කම් ලේඛනය
			(ii)	2005 ඔක්තෝබර් 18 දින පවරා ගෙන තිබුණු බස් සමාගම් 11 කට හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 7 කට අදාළ ක්ෂය අඩු කළ වටිනාකම වූ පිළිවෙලින් රු.3,141,290,735 ක හා රු.370,045,232 ක ස්ථාවර වත්කම් සම්බන්ධ සමීක්ෂණ මණ්ඩල වාර්තා / නොතිකට සනාථනය කළ සිට සාක්ෂි

(ආ)	ආයෝජන	295,540,691		උපලේඛන
(ඇ)	විවිධ ණයගැතියෝ	1,755,043,785	(i)	ශේෂ සනාථ කිරීම්
			(ii)	කාල විශ්ලේෂණ
(ඈ)	බැංකු ශේෂ	296,353,450		ප්‍රධාන කාර්යාලයට අදාළ බැංකු ගිණුම් හැර අනෙකුත් බැංකු ගිණුම් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ
	බැංකු අයිරාව	407,309,772		
(ඉ)	ණය හිමියෝ	4,627,322,423	(i)	කෝවල ගිණුම් පිළිබඳ විස්තර
			(ii)	කාල විශ්ලේෂණ
(ඊ)	තොග ශේෂය	1,576,900,365		තොග සමීක්ෂණ වාර්තා

2.2.9 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ)	මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථා මාලාව හා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත	සේවකයින්ගේ වැටුපෙන් අයකර ගන්නා අර්ථසාධක අරමුදල් දායකත්ව සහ මණ්ඩලයේ දායක වීම් සේවකයාගේ ඉපයීම් කළ අදාළ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට බැර කළයුතු වුවද, 2007 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා ඉකුත් වර්ෂ වල දායක මුදල් ද ඇතුළත්ව රු.559,376,279 ක මුදලක් මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට හා රු. 486,567,910 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවට බැර කර නොතිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත

සේවකයාගේ වැටුපෙන් 3% කට සමාන ප්‍රමාණයක් මණ්ඩලය විසින් සේවකයාගේ ඉපැයීම් කළ අදාළ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට බැර කළයුතු වුවද, 2007 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා ඉකුත් වර්ෂවල දායක මුදල් ඇතුළත්ව රු.51,699,930ක මුදලක් එසේ බැර කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ සැළ විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් කුමන වර්ෂයක් වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණේ ද යන්න නිරීක්ෂණය කළ නොහැකි විය.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 5:2:4 ඡේදය

මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අයවැය ලේඛනය අනුමත කළයුතු වුවත්, මණ්ඩලය එසේ කර නොතිබුණි.

(ii) 5.2.5 ඡේදය

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරනු ලැබූ අයවැය ලේඛනයේ පිටපතක් විගණකාධිපති වෙත අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළයුතු වුවද 2006 සිට 2011 වර්ෂ සඳහා වූ අයවැය ලේඛනයන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2011 ජුනි 18 දිනදීය.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලය රු.5,946,554,943 ක ආදායමක් ලබා තිබූ අතර භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.4,409,283,804 ක ප්‍රදාන හේතුවෙන් එම ආදායම රු.1,537,271,139 දක්වා අඩු වී තිබුණි. ඉකුත්

වර්ෂයේ රු.1,645,802,316 ක ආදායමක් ලබා ඇති අතර සමාලෝචිත වර්ෂය සමඟ සසඳන විට මූල්‍ය ප්‍රතිඵලවල රු. 108,531,177 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1958 වර්ෂයේදී බස් සමාගම් ජනසතු කිරීමේදී අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් රු.8,299,517 ක් වූ අතිකාරම් මුදලක් ගෙවා තිබුණි. එම අවස්ථාවන්හි දී ඉඩම් වල මුළු විධිමත් අයිතිකරුවන්ට නොගෙවීම නිසාවෙන් ඒවායේ අයිතිය මණ්ඩලය නමට පවරා ගැනීමට නොහැකිව තිබුණි. මෙම ඉඩම්වල පිහිටීම හා අයිතිය පිළිබඳව සොයාබලා ඉඩම් පනතේ 44 වගන්තිය යටතේ ක්‍රියාපටිපාටි කිරීමට හෝ නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2004 දෙසැම්බර් මාසයේදී මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල සේවකයන්ගේ වැටුපෙන් අයකර ඇරවුම් කිරීමේ පදනම මත පුනාම් පරමුදලට ගෙවා තිබුණු රු.3,403,534 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර රු.537,781 ක සේවකයින්ගේ වැටුපෙන් අයකර ගත් මුදල තැන්පතු ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) මුදල් අග්‍රිමයක් අවසන් වීමට ප්‍රථම එය ප්‍රතිපූර්ණය කරගත යුතු නමුත් 2007 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 28,398 ක් වූ අග්‍රිම ගිණුම් 2 ක බැර ශේෂ පෙන්නුම් කර තිබුණි. මේවා පදනාමෙන කිසි පරිදි ගිණුම් ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ මූලස්ථ ප්‍රකාශනවල දිගින් දිගට පැවති ගෙවීමකට පසු වූ භාණ්ඩ පේනුකරින් වූ රු.33,309,516 ක වෙනස්කිරීම් 2007 වර්ෂයේදී ද ගිණුම්වල පෙන්වා තිබුණ අතර මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ක්‍රියාත්මක නොවන වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් වූ රු.මිලියන1,221.307 ක ගිණුම් ශේෂ ලියා හැරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම පිණිස 2002 ජූලි 30 දින මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අමතා තිබුණි. එම ශේෂ සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂාවක් කර අවශ්‍ය මණ්ඩලයේ දැනීම හා අනුමැතිය මත ශේෂයන් ලියා හැරීමට යෝජනා කර තිබුණත් ඊ අනුව කටයුතු කර නොතිබුණි.

3.2.2 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිට්ටඹුව ඩිපෝවේ සේවකයන් විසින් වයඹ සංවර්ධන බැංකුවෙන් ලබා ගත් බැංකු ණය වාරික සේවක වේතනයෙන් අඩුකර ඇති නමුත් ඩිපෝව විසින් ගෙවීම් පැහැරහැරීම නිසා නඩු තීන්දුවක් මත එම ණය වාරික සඳහා පොලිය වූ රු. 865,257 ක් ගෙවීමට ඩිපෝවට සිදු වී තිබුණි.

(ආ) ණයහිමි ශේෂය තුළ සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාර අරමුදල වෙනුවෙන් වසතුළ රු. 17,312,659 ක අධිභාරයක් ගෙවිය යුතුව තිබුණි.

3.2.3. අයවැය පාලනය

අයවැයගත හා සත්‍ය සංඛ්‍යා අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන සාධකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින් වර වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) තොග පාලනය
(ඇ) ණයගැතියෝ හා ණයහිමියෝ
(ඈ) ගිණුම්කරණය
(ඉ) ගිණුම් ශේෂ සනාථ කිරීම
(ඊ) වත්කම් හා වගකීම් පවරා ගැනීම
(උ) ගිණුම් ශේෂ නිරවුල් කිරීම
(ඌ) අයවැය ලේඛනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති